# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
# உள்நாட்டு இறைவரித் திணைக்களம்
# INLAND REVENUE DEPARTMENT

ලේකම් අංශය
14 වන මහල
දේශීය ආදායම් ගොඩනැගිල්ල
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත
තැ.පෙ. 515, කොළඹ 2- ශ්‍රී ලංකාව

செயலகம்
14 வது மாடி
உள்நாட்டு இறைவரிக் கட்டிடம்
சேர் சிற்றம்பலம் ஏ காடினர் மாவத்தை
த.பெ.இல. 515, கொழும்பு - 2, இலங்கை

Secretariat
14th Floor
Inland Revenue Building
Sir Chittampalam A Gardiner Mawatha
P.O. 515, Colombo 2 - Sri Lanka

ෆැක්ස් / பக்ஸ் / Fax: 011 - 2338635

දුරකථන / தொலைபேசி / Telephone: 011- 2135406/ 2135410/ 2135412 / 2135413

E-Mail -tpl@ird.gov.lk / itp@ird.gov.lk
Web: www.ird.gov.lk


චක්‍රලේඛ අංක: SEC/2023/E/04

**2023 ජුලි 17**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, රජයේ සහ රාජ්‍ය සංස්ථා සහ මණ්ඩල ගණකාධිකාරීවරුන් සහ මූල්‍ය නිලධාරීවරුන් සඳහා වන චක්‍රලේඛය

## රජයට අත්පත් කරගනු ලබන ඉඩම් හෝ නිශ්චල දේපල වෙනුවෙන් ප්‍රදානය කරනු ලබන වන්දි මුදල් වෙනුවෙන් පොළී ගෙවීම් මත රඳවාගැනීමේ බද්ද/අත්තිකාරම් ආදායම් බද්ද අඩු කිරීම

පොදු කටයුතු සඳහා ශ්‍රී ලංකා රජය හෝ ශ්‍රී ලංකා රජය වෙනුවෙන්, පුද්ගලික ඉඩම් හෝ නිශ්චල දේපල අත්පත් කර ගැනීමේදී ගෙවනු ලබන වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වීම මත වන්දි මුදල් සඳහා හිමිකම් ඇති තැනැත්තන්ට සිදු කරනු ලබන පොළී ගෙවීමේදී, එම පොළී මුදල්වලින් රඳවාගැනීමේ බදු/අත්තිකාරම් ආදායම් බදු අඩු කිරීම සහ ඒ ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පැහැදිලි කිරීම සහ උපදෙස් ලබා දීම මෙම චක්‍රලේඛය මගින් සිදු කෙරේ.

### 1. රඳවාගැනීමේ බදු/අත්තිකාරම් ආදායම් බදු අඩු කිරීමේ වගකීම.

2021 අංක 10, 2022 අංක 45 සහ 2023 අංක 04 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත් මගින් සංශෝධනය වූ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 84අ(1අ) වගන්තිය ප්‍රකාරව**, තැනැත්තකු විසින්** 2023 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සහිත පොළී ගෙවීමක් මත 5% ක අත්තිකාරම් ආදායම් බද්දක් අය කරනු ලැබිය යුතුය.

මෙහි "තැනැත්තා" යන්නට පනතේ 195 වගන්තිය මඟින් අර්ථ නිරූපනය කරන ලද තැනැත්තන් පමණක් ඇතුළත් වන අතර ශ්‍රී ලංකා **රජය** ඊට ඇතුළත් නොවේ. ශ්‍රී ලංකා රජය යන්නෙන් **රජයේ යම් දෙපාර්තමේන්තුවක්, අමාත්‍යාංශ කාර්යාලයක් පළාත් පාලන ආයතනයක්** අදහස් වන නමුත් රාජ්‍ය සංස්ථා, රාජ්‍ය සමාගම් , මණ්ඩල හෝ රජයේ දෙපාර්තමේන්තුවක්/අමාත්‍යාංශ කාර්යාලයක්/ පළාත් පාලන ආයතනයක් විසින් පිහිටුවා ඇති ව්‍යාපෘති කාර්යාලයක් හෝ අරමුදලක් වැනි ආයතනයක් "ශ්‍රී ලංකා රජය " යනුවෙන් අර්ථ නිරූපනය නොවේ.

ඒ අනුව, රජයේ යම් දෙපාර්තමේන්තුවක්, අමාත්‍යාංශ කාර්යාලයක් හෝ පළාත් පාලන ආයතනයක්(මින් මතු මෙම චක්‍රලේඛයේ "**තැනැත්තකු නොවන රාජ්‍ය ආයතන**" ලෙස සලකනු ලබන) වෙත ඉහත පරිදි පොළී ගෙවීමේ නීතිමය වගකීම පවති නම් සහ ඒ අනුව, පොළී ගෙවීම සිදු කරනු ලබන්නේ නම් රඳවා ගැනීමේ බද්ද / අත්තිකාරම් ආදායම් බද්දක් අඩු කිරීම අවශ්‍ය නොවේ. එහෙත් ඉහත පරිදි ප්‍රදානය කරනු ලබන වන්දි මුදලකට අදාළව පොළී ගෙවීමේ නීතිමය වගකීම කිසියම් රාජ්‍ය සංස්ථාවක්, රාජ්‍ය සමාගමක් , මණ්ඩලයක් හෝ රජයේ දෙපාර්තමේන්තුවක්/අමාත්‍යාංශ කාර්යාලයක්/ පළාත් පාලන ආයතනයක් විසින් පිහිටුවා ඇති ව්‍යාපෘති කාර්යාලයක් හෝ අරමුදලක් වැනි ආයතනයක් (මින් මතු මෙම චක්‍රලේඛයේ "**තැනැත්තකු වන රාජ්‍ය ආයතන**" ලෙස සලකනු ලබන) වෙත පවතින විටක (උදා- මාර්ග සංවර්ධන අධිකාරිය, නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය සහ ජල සම්පාදන මණ්ඩලය වැනි), එවැනි පොළියකින් රඳවා ගැනීමේ බද්ද හෝ අත්තිකාරම් ආදායම් බද්ද ලෙස 5%ක් අඩු කර ගැනීම සිදු කළ යුතුය.

## 2. <u>අත්තිකාරම් ආදායම් බදු අඩු කිරීම.</u>

ඉහත 1 යටතේ පැහැදිලි කර ඇති පරිදි **තැනැත්තකු වන රාජ්‍ය ආයතනයක්**, 2023 ජනවාරි මස 01 දින සිට ගෙවනු ලබන සියලුම පොළී මුදල් වෙනුවෙන් (පොළී ගෙවීමේ වගකීම ඊට පෙර කාලයක සිට උද්ගත වුවද එය නොසලකා) 5% ක අත්තිකාරම් ආදායම් බද්දක් අඩු කළ යුතු වේ.

පොළී ගෙවීම සම්බන්ධයෙන් නීතිමය වගකීම ඉහත කී **තැනැත්තකු වන රාජ්‍ය ආයතනයකට** පවතින නමුත් මුදල් ගෙවීමේ කටයුතු පමණක් **තැනැත්තකු නොවන රාජ්‍ය ආයතනයක්** මගින් සිදු කරයි නම්, එකී **තැනැත්තකු වන රාජ්‍ය ආයතනය** මගින් පොළී මුදල් ඉහත කී **තැනැත්තකු නොවන** රාජ්‍ය ආයතනයට නිදහස් කිරීමේදී 5% ක අත්තිකාරම් ආදායම් බද්ද අඩු කර ඉතිරි මුදල් පමණක් ගෙවීම් සඳහා නිදහස් කළ යුතුය. එසේම, පොළී ගෙවීම සම්බන්ධයෙන් නීතිමය වගකීම ඉහත සඳහන් කළ **තැනැත්තකු නොවන රාජ්‍ය ආයතනයකට** පවතින නමුත් මුදල් ගෙවීමේ කටයුතු පමණක් **තැනැත්තකු වන රාජ්‍ය ආයතනයක්** මගින් සිදු කරයි නම් එම පොළිය මත 5% ක අත්තිකාරම් ආදායම් බද්දක් අඩු කළ යුතු නොවේ.

## 3. <u>බදු නිදහස් කිරීම්</u>

යම්කිසි පොළී ලාභියකුට පොළී ආදායම් සම්බන්ධයෙන් බදු නිදහස් කිරීමකට හිමිකම් ඇති නම්, එම පොළී ලාභියා විසින් ඒ සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පාරිභෝගික සහායක හා සංවර්ධන අංශයේ කොමසාරිස් මගින් ලිඛිතව සනාථ කර ගත් ලිපියක් ඉදිරිපත් කළ යුතු අතර එම සනාථ කිරීමේ ලිපියේ නම සඳහන් පුද්ගලයන්ට ගෙවනු ලබන පොළී ආදායම මත අත්තිකාරම් ආදායම් බද්ද අඩු කළ යුතු නොවේ.

ඒ ආකාරයෙන්, අදාල බදු නිදහස ලබාදී අත්තිකාරම් ආදායම් බද්ද අඩු නොකළ තැනැත්තන්ගේ තොරතුරු අදාළ බදු නිදහස සනාථ කරන ලද ලිපිවල පිටපත් ද සමග ගොනු කර තබා ගත යුතුවේ.

## 4. <u>තොරතුරු සැපයීම</u>

**තැනැත්තකු නොවන** හෝ **තැනැත්තකු වන** යම් රාජ්‍ය ආයතනයක් තම ආයතනය විසින් ගෙවූ පොළී මුදල් සම්බන්ධයෙන් (අත්තිකාරම් ආදායම් බද්ද අඩු කළ ද නොකළ ද) තොරතුරු ඇතුලත් වාර්තාවක් (පොළී ආදායම ලද තැනැත්තා, ජා.හැ.අංකය, ලිපිනය, වන්දි මුදල සහ ගෙවූ පොළිය, ගෙවීම් දිනය, අඩු කළ අත්තිකාරම් ආදායම් බද්ද, ඇතුළු විස්තර සහිත ) ගෙවීම් සිදු කළ මාසයට පසු මාසයේ 15 වන දිනට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තොරතුරු අංශය (කොමසාරිස්, තොරතුරු හා අනිවාර්ය ලියාපදිංචි අංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, 25 වන මහල, මෙහෙවර පියස, අංක 220, කිරුළ පාර, නාරාහේන්පිට , කොළඹ 05) වෙත ලබාදිය යුතුය.

## 5. අඩු කරන ලද බද්ද ගෙවීම් කිරීම, රඳවා ගැනීමේ බදු අඩු කිරීම් සහතික නිකුත් කිරීම සහ අනෙකුත් කරුණු

මේ සම්බන්ධයෙන් රඳවා ගැනීමේ අනුයෝජිතයින් සඳහා නිකුත් කරන ලද -2022 දෙසැම්බර් මස 23 දිනැති අංක SEC//2022/E/03 දරන චක්‍රලේඛයේ සඳහන් උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. මෙම චක්‍රලේඛය www.ird.gov.lk යන දේශීය ආදායම් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි ප්‍රකාශන :: චක්‍රලේඛන යටතේ ප්‍රසිද්ධ කර ඇත.

ඩී. ආර්. එස්. හපුආරච්චි
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

ඩී.ආර්.එස්. හපුආරච්චි
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත
කොළඹ 02.

පිටපත්: 1. ලේකම්, මුදල් අමාත්‍යාංශය
2. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
3. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් : සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත පිටපත් කිරීමට
4. සභාපති, මාර්ග සංවර්ධන අධිකාරිය
5. සභාපති, නිවාස සංවර්ධන අධිකාරිය
6. සභාපති, නාගරික සංවර්ධන අධිකාරිය
7. සභාපති, ජල සම්පාදන මණ්ඩලය